ලෝක ව්‍යාප්ත වසංගතයක් බවට පත්ව ඇති කොවිඩ්-19 මගින් ආරක්ෂා වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම, කොවිඩ්-19 මර්දනය සඳහා මාධ්‍යයන්ට දායක විය හැකි ආකාරයකි. කෙසේ වුවත්, එම දැනුවත් කිරීම් සිදුකරනා ආකාරය සම්බන්ධයෙන් පුද්ගලයින්ගේ පුද්ගල ගරුත්වයත්, පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතියත් සුරැකෙන ආකාරයේ ප්‍රවේශයක් ගැනීමේ වගකීමක් මාධ්‍ය අත තිබේ.

මැයි 31 අද දෙරණ සහ හිරු ටීවී ප්‍රධාන රූපවාහිනී පුවත් ඔස්සේ, ඒ ඒ රූපවාහිනී නාලිකා වල නිවේදකයින් විසින් කොවිඩ්-19 සෞඛ්‍ය නිර්දේශයන්ට අනුකූල නොවෙනා පුද්ගලයින්ව ප්‍රශ්න කෙරෙනු දක්නට ලැබිණි. එහිදී එම පුද්ගලයන්ගේ අනන්‍යතාවයද නොසඟවා දක්වන අයුරු නිරීක්ෂණය කළ හැකි විණි.

කොවිඩ්-19 තුන්වන රැල්ල මැඩපැවැත්වීමට සියලුදෙනා දැඩි වෙහෙසක් ගන්නා පසුතලයක, මුඛ ආවරණ හරි හැටි පැළඳීම ඇතුළු සෞඛ්‍ය නිර්දේශයන් පිළිපැදීම සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදුකිරීම සහ එසේ නොකිරීම ගැටළුවක් බව පෙන්වා දීම කාලීනව වැදගත් මාධ්‍ය දායකත්වයක් බව කිව හැකියි. නමුත් එහිදී පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වයට ඇති අයිතිය හා පුද්ගල ගරුත්වය නොසලකා හැරිය යුතුද? එය සුරකිමින් මෙම ගැටළුව සම්බන්ධයෙන් කථා කිරීම කළ නොහැකිද? මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

**#MediaEthicsSL #lka #SinhalaNews #HiruTV #deranatv  #TVNews**
**See less**